All Rights Reserved
සියලුම හිමිකම් ඇවිරිණි

# සිප්යාය මූලික පිරිවෙන් අවසාන සම්මන්ත්‍රණ මාලාව - 2020

## අන්තර් විශ්වවිද්‍යාලීය භික්‍ෂු බලමණ්ඩලය

කාලය පැය 02 යි | **(නව නිර්දේශය)** | ඉතිහාසය 02 පත්‍රය

- මෙම කොටස ප්‍රශ්න 08කින් සමන්විත වේ.
- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් (4) ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- මෙම කොටසට ලකුණු 60ක් හිමිවේ.

---

**01. (I). ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි පහත සඳහන් සියලු ස්ථාන ලකුණු කර නම් කරන්න.**

I. අනුරාධගාම
II. කුරුනෑගල
III. ජජ්ජර නදී
IV. පරාක්‍රම සමුද්‍රය
V. මහා තිත්ථ
VI. දේව නගර

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 1 බැගිනි)

❖ **පහත දී ඇති A හා B රූප සටහන් අධ්‍යනය කොට ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



A

ii. (අ) A වලින් දැක්වෙන පිළිමය කුමක් ද?.

(ආ) මෙය පිහිටි ඓතිහාසික නගරය කුමක් ද?.

(ඉ) මෙහි නිර්මාණකරුවා කවුද?.

(ලකුණු 3 යි)



B

iii. (අ) B වලින් දැක්වෙන පොකුණ කුමක් ද?.

(ආ) මෙය පිහිටා ඇත්තේ කොහෙද?.

(ඉ) මෙය ඉදිකළේ කිනම් රජු ද?.

(ලකුණු 3 යි)

**02. ''ඉතිහාසය අධ්‍යනයේ දී සාහිත්‍ය මූලාශ්‍ර ප්‍රධාන අංගයකි.''**

i. මූලාශ්‍රය ප්‍රධාන වශයෙන් කොටස් කීයද? ඒවා මොනවාද?.
ii. සාහිත්‍ය මූලාශ්‍රය ප්‍රධාන කොටස් දෙක නම් කොට ඒ සඳහා වෙන වෙනම උදාහරණ දෙක බැගින් සඳහන් කරන්න.
iii. ලාංකේය ඉතිහාසය හැදෑරීමෙහි ලා සාහිත්‍ය මූලාශ්‍රවල වැදගත්කම කරුණු තුනක් ඇසුරින් පැහැදිළි කරන්න.

(2+4+6=12 ලකුණු)

**03. ''දුටුගැමුණු රාජ්‍ය සමය ලාංකේය සමාජ සංස්ථාවන්හි හැරවුම් ලක්ෂයකි.''**

i. මෙතුමාගේ රාජ්‍ය කාලයේ වැදගත් සිදුවීම් දෙකක් නම් කරන්න.

ii. දුටුගැමුණු රජු රාජ්‍යත්වයට පැමිණීම කෙටියෙන් පහදන්න.

iii. මෙතුමාගේ ශාසනික සේවාව උදාහරණ සහිතව පහදන්න.

(2+4+6=12 ලකුණු)

04. I. අනුරාධපුර යුගයේ මෙරටට පැමිණි සංක්‍රමණික කණ්ඩායම් දෙකක් නම් කරන්න.

ii. ලාංකේය රජවරු දකුණු ඉන්දියාව සමඟ විවහා සහ ආගමික සබඳතා පැවැත්වීය. මෙය කෙටියෙන් පහදන්න.

iii. අනුරාධපුර යුගයේ ශ්‍රී ලාංකීය සමාජය හැඩගැසී තිබූ ආකාරය පැහැදිළි කරන්න.

(2+4+6=12 ලකුණු)

**05. I.** මහා පරාක්‍රමබාහු රජු විසින් ඉදිකළ වැව් දෙකක් නම් කරන්න.

ii. පරාක්‍රමබාහු රජු දක්ඛින දේශයේ පාලනයට පැමිණීම කෙටියෙන් පහදන්න.

iii. මහා පරාක්‍රමබාහු රජුගේ යුධ ව්‍යාපාරය කරුණු සහිතව පහදන්න.

(2+4+6=12 ලකුණු)

**06. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පෘතුග්‍රීසි හා ලන්දේසි පාලනය පහත සඳහන් මාතෘකා දෙක ඇසුරින් පැහැදිලි කරන්න.**

i. පෘතුග්‍රීසීන්ගේ ආමික බලපෑම.

ii. ලන්දේසීන්ගේ ආර්ථික බලපෑම.

(6×2=12 ලකුණු)

**07.** I. අග්නිදිග ආසියාතික බෞද්ධ රාජ්‍ය දෙකක් නම් කරන්න.

ii. බුරුමය හා ශ්‍රී ලංකාව අතර පැවති සබඳතා කෙටියෙන් පහදන්න.

iii. ඔබ කැමති අග්නිදිග ආසියාතික රාජ්‍යයන් දෙකක බුදු දහමේ ව්‍යාප්තිය හා එහි සංවර්ධනය ඇතිවූ ආකාරය පැහැදිලි කරන්න.

(2+4+6=12 ලකුණු)

08. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් පිළිබඳ ඓතිහාසික තොරතුරු දක්වන්න.

i. 1818 නිදහස් සටනට පසුබිම් වූ හේතු

ii. කුරුණෑගල යුගයේ සාහිත්‍ය ය.

iii. සොක්‍රටීස් (ක්‍රි.පූ. 489 - 399)

iv. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා.

(6×2=12 ලකුණු)